**ශීර්ෂය 230 - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්වාගණනය කළ මතය**

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 ජූනි 12 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

--------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

**(අ)** ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

**(ආ)** දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුදල් පොත අනුව ශේෂයක් පෙන්නුම් නොකළද, මූල්‍ය ප්‍රකාශයන් හි ඇතුලත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ මුදල් වල ශුද්ධ වෙනස්වීම් යටතේ 2018 දෙසැම්බර් 31දිනට මුදල් ශේෂය රු. 1,122,073 ක් ලෙස දක්වා තිබුණි. එසේම මෙම වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් වැය කිරීම් යටතේ භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම ලෙස දක්වා නොතිබුණි. | චක්‍රලේඛ අංක 267/2018 විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | මෙම ඡේදයේ කරුණු සමඟ එකඟ වේ. අතපසුවීමකින් භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිමය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ නියමිත ස්ථානයේ සටහන් කිරීමට නොහැකි වීම නිසා මෙම දෝෂය සිදු වී ඇත. 2019 වසරේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේ දී මෙම කරුණ නිවැරදිව සටහන් කිරීමට උපදෙස් ලබා දී ඇත. |

## 1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව හෝ යාවත්කාලීන කර නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **ඇප ලේඛනය**<br>මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) හි සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වේ. | මෙම ඡේදයේ සඳහන් කරුණු සමඟ එකඟ වේ. අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 01/2011 ප්‍රකාරව ඉදිරියේ දී කටයුතු කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. |
| **හානි පිළිබඳ ලේඛනය**<br>මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා තිබුණද, සමාලෝචිත වර්ෂයේ සිදු වූ වාහන අනතුරු 06 ක තොරතුරු ඇතුලත් කර ලේඛනය යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කල යුතුවේ. | මෙම ඡේදයේ සඳහන් කරුණු සමඟ එකඟ නොවේ. හානි පාඩු ලේඛනයක් පවත්වාගෙන යනු ලබන අතර එය යාවත්කාලීන කිරිමට 2018 වසර තුළ මෙම දෙපාර්තමේන්තුවට කිසිදු පාඩුවක් දැරීමට සිදු වී නොමැත. |

## 1.6.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 104 (3) හා 104 (4) මුදල් රෙගුලාසි | පාඩු හා හානි සම්බන්ධයෙන් පරිපූරණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 07කට වැඩි ප්‍රමාදයක් සිදු වේ නම් මුදල් රෙගුලාසි 104 (03) ප්‍රකාර ප්‍රාරම්භක වාර්තාවක් ඉදිරිපත් කල යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ සිදු වී තිබූ වාහන අනතුරු 06 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. එසේම පරීක්ෂණයෙන් පසු අලාභ හානි සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුළතදී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළයුතු වුවද එසේ ද කටයුතු කර නොතිබුණි. | හානිය සම්බන්ධව පරිපූරක වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 07 වැඩි ප්‍රමාදයක් වේ නම් මුදල් රෙගුලාසි 104 (3) ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වේ. | මෙම ඡේදයේ සඳහන් කරුණු සමඟ එකඟ වේ.<br><br>වාහන අනතුරු සම්බන්ධයෙන් ඉදිරියේ දී මුදල් රෙගාලාසි 104 අනුව කටයුතු කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| **(අ)** මූලධන වැය විෂයයන් 03 ක් හා පුනරාවර්තන වැය විෂයයන් 03 ක් සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය වූ රු.මිලියන 36.98 කින් රු.මිලියන 7.06 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනවලින් සියයට 07 සිට සියයට 78 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. | මෙම ඡේදයේ සඳහන් කරුණු සමඟ එකඟ වේ.<br>වැය විෂයයන්ගේ ප්‍රතිපාදන ඉතිරි වීමට හේතු පහත දැක්වේ.<br>අපේක්ෂා කල පරිදි වියදම් සිදු නොවීම, ''වෙස්ට්ලෝ ඩේටා බේස්'' මිලදී ගැනීමේ දි ලබා දුන් විශේෂ මිල අඩු කිරීම,2018 වසරේ දී සහකාර නීති කෙටුම්පත් සම්පාදක නිලධාරීන් වැඩි වශයෙන් විදේශ පුහුණු වීම සඳහා යොමු කරන ලද අතර එම නිලධාරීන් හට අදාල දීමනා ගෙවනු ලබන්නේ චක්‍රලේඛනයේ 11 වන ගණය යටතේ වීම හා ''වෙස්ට්ලෝ ඩේටා බේස්'' මිල දී ගැනීමට වැඩ කටයුතු සිදු වෙමින් පැවතීම හේතුවෙන් නීති පොත් මිලදී ගැනීමට අවශ්‍ය නොවීම නිසා ප්‍රතිපාදන ඉතිරි විය. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 267/2018 හි 3.4 ඡේදයේ විධි විධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක iii හි යටතේ වන බැදීම් හා බැරකම් ප්‍රකාශය භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම ශීර්ෂවලට අදාලව නිකුත් කරනු ලබන බැදීම් හා බැරකම් ප්‍රකාශය සමඟ එකඟ වියයුතුය. එහෙත් දෙපාර්තමේන්තුවට අදාලව භාණ්ඩාගාරය විසින් නිකුත් කර තිබූ බැරකම් පිළිබඳ ලේඛනයේ බැරකම් වටිනාකම හා මූල්‍ය ප්‍රකාශනයෙහි සටහන් අංක (iii) දක්වා ඇති වටිනාකම් අතර රු.මිලියන 2.58 වෙනසක් නිරීක්ෂණය විය. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 267/2018 හි 3.4 ඡේදයේ විධි විධාන ප්‍රකාර අවශ්‍ය සැසඳීම් කටයුතු කළ යුතු වේ. | මෙම ඡේදයේ සඳහන් කරුණු සමඟ එකඟ නොවේ. ශීර්ෂ අංක 230 ට අදාළ භාණ්ඩාගාරය විසින් නිකුත් කර ඇති බැරකම් ප්‍රකාශය නිවැරදි නොවේ. එනම් 2018 දෙසැම්බර් මස සිදු කරන ලද වියදම් කිහිපයක් බැරකම් ප්‍රකාශය ලෙස සහතික කර එවා ඇත. එකී වාර්තාවේ සඳහන් සියලුම වියදම් 2018 දෙසැම්බර් මස ගෙවීම් සිදු කර අවසන් කරන ලද ඒවා වේ. සත්‍ය වශයෙන්ම මෙම දෙපාර්තමේන්තුවට අදාල බැරකම් මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් අංක (iii) ආකෘතියෙහි ඇතුලත් කර ඇත. මෙම දෙපාර්තමේන්තුවට අදාල 2018 වසරේ මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් අංක (iii) ආකෘතියෙහි වූ බැරකම් සිගාස් වැඩසටහන් හරහා මහා භාණ්ඩගාරය වෙත ප්‍රේෂණය කරනු ලැබුවද, තාක්ෂණික දෝෂයක් හේතුවෙන් මෙවැන්නක් සිදු වී ඇති බව අනුමාන කල හැක. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2018 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයෙන් හා අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම තුල සංවිධාන ව්‍යුහය, අනුමත හා තත්‍ය කාර්යමණ්ඩලය, ප්‍රමුඛතා අනුව පිළියෙල කළ ක්‍රියාකාරකම් සැලැස්ම, ක්‍රියාත්මක කළ යුතු කාල රාමුව, අපේක්ෂිත නිමවුම හා අක් මුදල් සැලැස්ම වැනි කරුණු අඩංගු වී නොතිබුණි. එමනිසා එම ක්‍රියාකාරී සැලැස්ම උක්ත චක්‍රලේඛය ප්‍රකාරව සකස් කර නොතිබුණි. | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කළ යුතු තොරතුරු නිසි පරිදි ඇතුළත් කර ක්‍රියාකරී සැලැස්ම පිළියෙල කළ යුතුවේ. | මෙම ඡේදයේ සඳහන් කරුණු සමඟ එකඟ වේ.2019 වර්ෂයේ සිට 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරිමට කටයුතු කරනු ලැබේ. |

### 3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රු.මිලියන185 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයක් සහිතව නීති ප්‍රඥප්ති ඒකාබද්ධ කොට ප්‍රතිශෝධනය කිරීමේ ව්‍යාපෘතිය 2014 ජුලි 01 දින ආරම්භ කර 2017 දෙසැම්බර් 31 දිනට නිම කිරීමට නියමිතව තිබුණද එසේ නිම කර නොතිබු අතර 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා රු.මිලියන 9.71 ක් වැය කර තිබුණි. | ලබා දී ඇති කාල රාමුව තුල ව්‍යාපෘතියේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කරමින් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු කරා ලගා වීමට කටයුතු කළ යුතුවීම. | මෙම ඡේදයේ සඳහන් කරුණු සමඟ එකඟ වේ.<br>මෙම ව්‍යාපෘතිය 2014.07.21 වන දින ආරම්භ කරන ලදී. ආරම්භයේ දී, ව්‍යාපෘතියේ වැඩකටයුතු 2017 වර්ෂය තුළ අවසන් කිරිමට අපේක්ෂා කරනු ලැබුව ද පනත් කෙටුම්පත්කරණයේ සුවිශේෂි නිපුණතාවයක් ඇති නිලධරයන් විසින්, සියුම්ව, තාක්ෂණික අගැයීමකට ලක්කර, බුද්ධියමෙහෙයවා, මෙම ව්‍යාපෘතියේ වැඩකටයුතු කරයි. බහුතරයක් |

| | | |
|---|---|---|
| | | නිලධරයන් මෙම දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය රාජකාරී කරන නීති නිලධරයන් වීමත්, මෙම ව්‍යාපෘතිය සැලසුම් කිරීමේ දී අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා අධික කාලයක් වැය වන වැඩ ප්‍රමාණයක් ඉටු කිරීමට සිදුවීමත් යන කාරණා හේතුවෙන් මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු 2017 වර්ෂය තුළ අවසන් කිරීමට නොහැකි විය. මෙම ව්‍යාපෘතිය සඳහා 2018 ජනවාරි මස 01 සිට තවත් මාස 06 ක් දික්කරන ලෙස අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇත. |

## 3.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 880(1) අනුව රජයේ මුදල් හා මුද්දර භාරව සිටින සහ වවුචර් සහතික කරන හා චෙක්පත් අත්සන් කරන නිලධාරින් රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු වුවද, නිලධාරීන් හත්දෙනෙකු (07) ඇප තබා නොතිබුණි. | මුදල් රෙගුලාසි 880, 2011 ජනවාරි 08 දිනැති අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 01/2011 හා 2014 මැයි 07 දිනැති අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 01/2011 (I) හි විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මෙම ඡේදයේ සඳහන් කරුණු සමඟ එකඟ වේ. රජයේ නිලධාරීන්ගේ ඇප ලැබීම සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුව විසින් 2009 වර්ෂයෙන් පසුව කටයුතු කර නොමැත. එබැවින් මේ සම්බන්ධයෙන් අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛය අනුව කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. |

## 3.4 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දී ඇස්තමේන්තු අගය රු.530,250 ක් වූ වාහන අනතුරු 06 ක් සම්බන්ධයෙන් වාර්තා වී තිබුණි. ඒ සම්බන්ධයෙන් රක්ෂණය මගින් අය කර ගැනීමෙන් පසු තවදුරටත් අයකර ගත යුතු අලාභය රු.100,133 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනයෙහි සටහන් අංක (i) යටතේ මෙකී අලාභයන් වාර්තා කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 102 සිට 110 දක්වා වන විධිවිධාන ප්‍රකාර පාඩු හා හානි සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වේ. | මෙම ඡේදයේ සඳහන් කරුණු සමඟ එකඟ නොවේ.<br>සමාලෝචිත වර්ෂය තුලදී වාහන අනතුරු 06 ක් සිදු වී තිබුණද, රක්ෂණ ආයතනය විසින් ගෙවන ලද මුදලට අදාළ අලුත්වැඩියාවන් සිදු කර දීමට ගරාජයන් එකඟ වූ බැවින් විගණන වාර්තාවේ සඳහන් කර ඇති ආකාරයට මෙම දෙපාර්තමේන්තුව කිසිදු අලාභයක් දැරීමට සිදු වී නොමැත. |

## 4. යහපාලනය

## 4.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40.1 වගන්තියේ විධිවිධාන ප්‍රකාර දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා සුදුසු විගණනවරයෙකු පත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන විගණන පනතේ 40 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මෙම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණනය අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මඟින් සිදු කරන අතර අවසන් වරට 2017 දෙසැම්බර් 05 දින අභ්‍යන්තර විගණනයක් සිදු කරන ලදී. එහි වාර්තාවේ එවා තිබුණේ 2018 වර්ෂයේදීය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| යහපත් රාජ්‍ය පාලනයක් ඇති කිරීම සඳහා ආණ්ඩුවේ නොයෙකුත් ප්‍රතිපත්ති නීතිය බවට පරිවර්තනය කිරීමේ නීති කෙටුම්පත්කරන කාර්යභාරය ඉටුකිරීම සඳහා සෘජුවම දායකත්වය ලබාදෙන ජ්‍යෙෂ්ඨ මට්ටම හා තෘතීයක මට්ටම සඳහා අනුමත තනතුරු 70 න් 28 ක් ම පුරප්පාඩුව පැවතුණි. මෙකී පුරප්පාඩු දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය කෙරෙහි සෘජුවම බලපෑම් ඇති කරවන්නක් විය. තවද 2018 දෙසැම්බර් 31 දිනට සමස්ත පුරප්පාඩු සංඛ්‍යාව 50 ක් විය. | කාර්ය සාධනය සඳහා සෘජුවම බලපාන අනුමත කාර්යමණ්ඩලයට අයත් තනතුරු හි පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම ඡේදයේ සඳහන් කරුණු සමඟ එකඟ වේ. |